**වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව**
**වවුනියාව දිස්ත්‍රික්කය**
-------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 22 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කල මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

අ). සමාලෝචිත වර්ෂය සඳහා කඩ බදුකරුවන් දස දෙනෙකුගෙන් අයවිය යුතු කඩ කුලිය රු. 173,750 ක් වුවත් රු.146,450 ක් ලෙස ගිණුම් ගත කිරීම මඟින් රු. 27,300 ක වෙනසක් විය.

ආ). සමාලෝචිත වර්ෂය සඳහා වූ වෙළඳ බලපත්‍ර ආදායම රු. 113,600 කින් අධිගණනය වී තිබුණි.

ඇ). බැංකු ශේෂ සනාථන ලිපි අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 07 ක ශේෂයන්ගේ එකතුව රු. 7,061,053 ක් වුවත් එය රු. 7,092,748 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමෙන් රු. 31,695 ක වෙනසක් විය.

ඈ). අංක 77877441 දරණ ලංකා බැංකු ස්ථාවර තැන්පතුව සඳහා, සමාලෝචිත වර්ෂයට අදාලවූ රු. 65,384 ක පොලී ආදායම ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 **නොසැසඳු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වල විෂයයන් 10 කට අදාළව ආරම්භක ශේෂයන්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අවසන් ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 4,063,127 ක වෙනසක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

----------------------------------------

අ). 2016 සැප්තැම්බර් 30 වන විට විගණන විමසුමකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබු අතර එකී විමසුමට භාජනය වූ ගණනය කල හැකි ගණුදෙනුවල වටිනාකම රු. 6,700,534 ක් විය.

ආ). රු. 962,945 ක් වූ පුස්තකාල පොත් වල වටිනාකම සනාථ කිරීමට විස්තරාත්මක උප ලේඛණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 4,158,148 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,044,765 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

අ). විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් අය කරන ලද රු. 927,934 ක් වූ උසාවි දඩ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟව පැවතුණි.

ආ). 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (ආ) වගන්තිය ප්‍රකාරව 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සභාවට ලැබිය යුතු රු. 1,993,932 ක් හිඟ මුද්දර ගාස්තු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 **බදු කුලී**

---------

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරණ චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර කුලී වසර 5 කට වරක් වත් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවා සංශෝධනය කලයුතු වුවත් එසේ තක්සේරු කරනු ලැබූ සංශෝධිත කුලී අයකිරීමක් සිදු නොකර මිල ගණන් කැඳවීමක් සිදුකර සභාව සතු කඩකාමර 10 ක් හා සතිපොළ 2ක් කුලියට ලබා දී තිබුණි.

2.2.3 **වෙළඳ බලපත්‍ර**
----------------

අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීතී 59 හි විධි විධාන අනුව සෑම වර්ෂයක් ආරම්භයේදී සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා වෙළඳ ව්‍යාපාර ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

ආ). තවද සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබාගතයුතු ව්‍යාපාරික ස්ථාන සම්බන්ධයෙන්ද සභාව විසින් හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**
------------------------------

අ). ජර්නල් සටහන් ලේඛණයට අළුතින් ජර්නල් සටහනක් ඇතුලත් කිරීමේදී ප්‍රාදේශීය සභාවේ ලේකම් හෝ වගකිව යුතු නිලධාරියෙකු විසින් ඊට අදාල අනුමැතිය ලබා දිය යුතු වුවත් රු.3,113,045 ක වටිනාකමක් සමුච්චිත අරමුදලට මාරු කිරීමට අනුමැතිය ලබාගෙන නොතිබුණි.

ආ). සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 112,347 ක ණය ශේෂය 2013 වර්ෂය අවසානයේ සිට පවතින අතර 2014 හා 2015 යන වර්ෂවලදී ඉන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.

ඇ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (2) හා (3) අනුව ඉකුත් වූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීම හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීම සිදුකල යුතු වුවත් රු.1,150,383 ක් වටිනා ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

ඈ). 2002 ජුලි 30 දිනැති අංක 364 (3) දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව එක් එක් මාසය සඳහා ගෙවනු ලැබූ එකතු කල අගය මත බදු (VAT) පිළිබඳ විස්තර විගණකාධිපතිට පිටපතක් සහිතව ඊලඟ මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු වුවත් 2014 වර්ෂයේ ගෙවනු ලැබූ රු. 2,777,659 ක් ද ප්‍රවර්ථන වර්ෂය සඳහා ගෙවනු ලැබූ රු. 2,050,327 ක එකතු කළ අගය මත බදු මුදල් සම්බන්ධව ද ඉහත පරිදි කටයුතු කර නොතිබුණි.

3.2 **වත්කම් කළමනාකරණය**
---------------------------

3.2.1 **නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**
----------------------------------------

අ). සභාව සතු ට්‍රැක්ටර් 04ක් 2012 වර්ෂයේ සිටද, ජීප් රථයක් 2013 වර්ෂයේ සිටද, ටිපර් රථයක් හා බවුසර් රථයක් 2014 වර්ෂයේ සිටද, 1996 ජුනි 12 වන දින ලැබී තිබූ යතුරු පැදියක් දීර්ඝ කාලයක සිටද ඌන උපයෝජිතව ගාල් කොට තිබුණි.

ආ). සමාලෝචිත වර්ෂයේදී සභාව සතු කඩකාමර 4ක් පිළිවෙලින් මාස 8 සිට මාස 12ක කාලයක් බදු දීමට කටයුතු නොකිරීමෙන් සභාවට අහිමි වූ ආදායම රු.61,500 ක් විය.

3.2.2 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

**-----------------------------**

2014 ඔක්තෝබර් මස 17 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2014 හි 3.5 ඡේදය අනුව සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර ඌනතා හා අතිරික්තතා වාර්තාව අනුව විනාශ කල යුතු භාණ්ඩ විනාශ කිරීම, අළුත් වැඩියා කලයුතු භාණ්ඩ අළුත් වැඩියාව හා වෙන්දේසි කලයුතු භාණ්ඩ වෙන්දේසි කර අවසන් කිරීම සිදුකල යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ එසේ තිරණය කල භාණ්ඩ 31ක් සම්බන්ධයෙන් හා 2015 වර්ෂයේ භාණ්ඩ 17 ක් සම්බන්ධයෙන්ද කටයුතු කර නොතිබුණි.

3.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

3.3.1 **ඉරට්ටපෙරියකුලම් පළමු හරස් මාර්ගයේ කොන්ක්‍රීට් පාර ඉදිකිරීම.**

**-----------------------------------------------------------------------**

මෙම මාර්ගයේ දිග මීටර 70 ක්, කොන්ක්‍රීට් අතුරා සකස් කිරීමට රු. 596,481 ක් කොන්ත්‍රාත්තු ආයතනයකට 2016 ජනවාරි 25 දින ගෙවා තිබුණි. එකී මාර්ගයේ කොන්ක්‍රීට් යෙදීමට පෙර දෙපස කොන්ක්‍රීට් පාදමක් යෙදිය යුතු වුවත් එලෙස නොයොදා ඉදිකිරීම් කර තිබු බව 2016 ජුනි මස 2 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය. මුදල් ප්‍රමාණවත් නොවීම යැයි සභාවේ ලේකම් පැවසුවත් එමඟින් මාර්ගයේ පැවැත්මට හා ආයුකාලයට හානිකර බව නිරීක්ෂණය විය.

ආ). **ඉරට්ටපෙරියකුලම් දෙවන හරස් මාර්ගයේ පළමු වීදියේ තාර දමා ඉදිකිරීම.**

---------------------------------------------------------------------------------

මෙම මාර්ගයේ මීටර 60 ක දුරක් ගල් අතුරා තාර දැමීම සඳහා රු. 263,495 කට 2015 නොවැම්බර් 26 දින ගිවිසුම්ගතව රු. 243,871 ක් කොන්ත්‍රාත්කරුට 2016 ජනවාරි 13 දින ගෙවා තිබුණි. එකී මාර්ගයේ මීටර් 25 ක දුර ප්‍රමාණයක් පළල් නොකර පටු ලෙස උරහිස් රහිතව තිබීමෙන් මාර්ගය දෙපසට නෙරා ගොස් තිබු බව 2016 ජුනි මස 2 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය.

3.3.3 **ඉරට්ටපෙරියකුලම් පළමු හරස් මාර්ගය තාර දමා ඉදිකිරිම.**

**------------------------------------------------------------**

මෙම මාර්ගයේ දිග මීටර 270 ක් ගල් අතුරා තාර දැමීමට රු. 1,260,000 කට 2015 අගෝස්තු 20 දින ගිවිසුම්ගතව රු. 1,778,774 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මෙම මාර්ගයේ උරහිස් සමඟ මුළු පළල මීටර් 5.20 ක් හා තාර දැමු කොටසේ පළල මීටර් 3.7 ක් විය යුතු වුවත් මාර්ගයේ එක් ස්ථානයක් 2016 ජුනි 02 දින පරික්ෂා කර ලබාගත් මිණුම් අනුව එක් උරහිසක පළල මීටර් 0.625 ක් ද තාර දැමු කොටසේ පළල මීටර් 3.55 ක් ද විය. ඒ අනුව එක් උරහිසක පළල මීටර් 0.125 ක් අඩුවෙන්ද තාර දැමු කොටසේ පළල මීටර් 0.15 ක් අඩුවෙන්ද ඉදිකර තිබුණි. තවද උරහිස් වෙනුවෙන් රු. 8,640 (67.5 m* රු. 128) ක් ද තාර දැමු කොටස් වෙනුවෙන් රු. 37,825 (40.5 m* රු. 933.95) ක් වැඩියෙන් ගෙවා තිබුණි.

4 **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**
**----------------------------------------**

4.1 **අභ්‍යන්තර විගණනය**
**----------------------**

කළමණාකරන විගණන දෙපාර්තුමේන්තුවේ 2012 ජනවාරි මස 13 දිනැති DMA/2012/101 දරන චක්‍රලේඛය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා පරිගණක ගත තොරතුරු පද්ධතියක් තුල (CIS) අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීම සිදු කලයුතු බවට මාර්ගෝපදේශ හා ප්‍රශ්ණාවලියක් හඳුන්වා දී තිබුණද එපරිදි කටයුතු කර නොතිබුණි.

5. **පද්ධති හා පාලනය**
**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමණාකරනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) අභ්‍යන්තර විගණනය